# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA


දුරකථනය
Telephone } +94 11 2758230
+94 11 2803473
ෆැක්ස්
Fax } +94 11 2801604
මගේ අංකය
My Number } ASP/03
ඔබේ අංකය
Your Number }

නුගේගොඩ,
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.
තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
POST OFFICE BOX - 6 - NUGEGODA.

Email : drasp@sjp.ac.lk
Web : www.sjp.ac.lk


2021.02.18

**විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රවේශය - 2019 / 2020 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා **කළමනාකරණ පොදු/ විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂ)/ විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරුකරණ (විශේෂ)/ විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ)/ වාණිජවේදී (විශේෂ)** උපාධි පාඨමාලාව හැදෑරීමට ඔබව තෝරාගෙන ඇති බව සතුටින් දැනුම් දෙමි.

1. අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි වීම

**2021.03.01** සිට **2021.03.04** දින දක්වා අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීම අනිවාර්ය බැවින් පහත සඳහන් කරුණු ඉතා හොඳින් අධ්‍යයනය කර එම පියවර අනුගමනය කරමින් ලියාපදිංචි කටයුතු සිදුකරන ලෙස කාරුණිකව දන්වමි.

i. කරුණාකර විශ්වවිද්‍යාලයීය වෙබ්අඩවිය **www.sjp.ac.lk** වෙත පිවිස **"Student Enrolment"** තෝරන්න.

ii. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ උසස් පෙළ විභාග අංකය යොදා මාර්ග ගත ක්‍රමයට ලියාපදිංචි වීමේ පද්ධතිය වෙත පිවිසෙන්න.

iii. පිවිසීමෙන් පසු ලබාදී ඇති ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීම සිදුකළ යුතු බැවින් ඒ සඳහා පහත පියවර අනුගමනය කළ යුතුය. (ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා පිවිසීමට පෙර පහත කරුණු ඉටු කර තිබීම වඩාත් යෝග්‍ය වන අතර ඒවා ඇතුළත් (upload) කිරීම අත්‍යාවශ්‍ය වේ.)

- පාස්පෝට් ප්‍රමාණයේ (45mm උස x 35mm පළල) සුදු පසුබිමෙහි වර්ණ උඩුකය (මාස 06 කට වඩා පැරණි නොවන) ඡායාරූපයක මෘදු පිටපතක් (soft copy) ඡායාරූප ශාලාවකින් ලබාගෙන එය jpg මාධ්‍යයෙන් ඇතුළත් කළ යුතුය.
(පරිලෝකනය (scan) කරන ලද ඡායාරූප, උඩුකය අපැහැදිලි ඡායාරූප, සිනහවෙමින් හෝ ඇස් පිය වී ඇති ඡායාරූප, උපැස්යුවළ සහිත ඡායාරූප, ප්‍රමිතියෙන් තොර වර්ණ සහිත ඡායාරූප, නළල සහ හිස වැසෙන සේ ඇති ඇඳුම් සහිත ඡායාරූප, අනුමත නොකරණ ඡායාරූප මෙම අයදුම් පත්‍රයට ඇතුළත් නොකළ යුතුය.)

- ඔබගේ උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපත් ගෙන ඒවා සියල්ලක්ම සාමදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ සත්‍ය පිටපතක් ලෙස සහතික කර, වෙන් වෙන් වශයෙන් පැහැදිලි වර්ණ පරිලෝකන (scan) පිටපත් pdf මාධ්‍යයෙන් ලබාගෙන ඇතුළත් කළ යුතුය.
(අපැහැදිලි පරිලෝකන පිටපත්, ජංගම දුරකථන හෝ වෙනත් උපකරණ භාවිතයෙන් ලබාගත් ඡායාරූප ඇතුළත් කිරීම නොකළ යුතුය.)
(දෙමළ භාෂාවෙන් පමණක් පවතින උප්පැන්න සහතිකවල ඉංග්‍රීසි පරිවර්තනයක පිටපත පමණක් ඉහත පරිදි pdf මාධ්‍යයෙන් ඇතුළත් කළ යුතුය.)

- මෙම ලිපිය සමඟ ලබා දී ඇති නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා නොකරන බවට ඇති ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එහි වර්ණ පරිලෝකන (scan) පිටපත pdf මාධ්‍යයෙන් ඇතුළත් කළ යුතුය. (මෙම ආකෘති පත්‍රය නිසි පරිදි අත්සන් කර ගැනීමට කාලය නොමැතිනම් පමණක් ඒ සඳහා මාසයක පමණ කාලයක් ලබා දෙන අතර නැවත වරක් පෙර පරිදි මාර්ග ගත ක්‍රමයට ලියාපදිංචි වීමේ පද්ධතිය වෙත පිවිස එය ඇතුළත් (upload) කිරීම සිදුකළ හැකිය.)

iv. නේවාසිකාගාර පහසුකම් / ශිෂ්‍යාධාර සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන්නේනම් ඒ සඳහා පිවිස අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය.

v. ඉහත ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මුදල් ගෙවීමේ කටයුතු සඳහා පිවිසීමට ඔබට හැකියාව ලැබෙන අතර ඇතුළත් වීමේ ගාස්තුව **රු.550/-** ක් ලෙස සඳහන් කිරීමෙන් පසුව ඔබට අනන්‍ය වූ බැංකු ගිණුම් අංකයක් සඳහන් අකෘති පත්‍රයක් ලැබෙනු ඇත. (පළමු අධ්‍යයන වර්ෂය සඳහා ඔබගේ ඇතුළත් වීමේ ගාස්තුව **රු.550/-** ක් වන අතර, එම මුදල් ගෙවීම සඳහා මහජන බැංකුවෙන් මුදල් තැන්පත් කිරීමේ පත්‍රිකාවක් ලබාගෙන එම පත්‍රිකාව ඔබවෙත ලැබී ඇති බැංකු පත්‍රිකාවේ ආකෘතියේ සඳහන් පරිදි සම්පූර්ණකර **2021.03.04** දිනට පෙර මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.550/- මුදලින් ගෙවා ආදාළ රිසිට්පත ලබාගන්න.)

**ඉහත සඳහන් ලෙස සකස් කරගත් හා මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි වීමේ පද්ධතියට ඇතුළත් (upload) කළ ලිපිලේඛණ සුරැකිව ඔබ සතුව තබාගත යුතු අතර අවශ්‍යවන ඕනෑම අවස්ථාවක එම පිටපත් හා ඒවායේ මුල් පිටපත් විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.**

## 2. විශ්වවිද්‍යාලයීය හැඳුනුම්පත

සියලුම සිසුන්ට විශ්වවිද්‍යාලයීය හැඳුනුම්පතක් නිකුත්කරනු ලැබේ.

## 3. විශ්වවිද්‍යාල ප්‍රවේශය ප්‍රමාද කිරීම

2019/2020 වසරට ලියාපදිංචි වූ එහෙත් අධ්‍යයන වැඩසටහනට සම්බන්ධවීමට නොහැකිවන සිසුන්ට වෛද්‍ය හෝ වෙනත් විශේෂිත හේතුමත අධ්‍යයන වර්ෂය දීර්ඝ කරගත හැක්කේ එක් අධ්‍යයන වර්ෂයකින් පමණි. එවැනි ඉල්ලීම් අදාළ පීඨයේ පීඨාධිපති වෙත වෛද්‍ය සහ අනෙකුත් අදාළ ලිපි ලේඛණ සමග ඉදිරිපත් කළ යුතුය. මෙම ඉල්ලීම් ඉදිරිපත් කළ යුත්තේ ඔබ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වීමෙන් පසුව පමණි.

## 4. පසුව ලියාපදිංචිය ලබාගැනීම

නිසි පරිදි ලියාපදිංචි නොවූ හෝ නිසි පරිදි ප්‍රවේශය දීර්ඝ කරනු නොලැබූ සිසුන් පසුකාලීනව විශ්වවිද්‍යාලයට ඇතුලත්වීම සඳහා කරනු ලබන ඉල්ලීම් සළකා බලනු නොලැබේ. එම පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබේ.

## 5. ශිෂ්‍ය අත්පොත

විශ්වවිද්‍යාලය පිළිබඳ සියලු විස්තර ඇතුළත් ශිෂ්‍ය අත්පොතේ (Student Handbook) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය පිටපත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.sjp.ac.lk/students) ලබා ගත හැකිය.

එල්.එල්. වසන්ත පෙරේරා
නියෝජ්‍ය ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු හා ප්‍රකාශන අංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

දුරකථනය / Telephone } +94 11 2758230, +94 11 2803473
ෆැක්ස් / Fax } +94 11 2801604
මගේ අංකය / My Number } ASP/03
ඔබේ අංකය / Your Number }

නුගේගොඩ,
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.
තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
POST OFFICE BOX - 6 - NUGEGODA.

Email : drasp@sjp.ac.lk
Web : www.sjp.ac.lk

18.02.2021

## UNIVERSITY ENROLMENT OF STUDENTS - ACADEMIC YEAR 2019/2020

It is with great pleasure I inform you that you have been selected to the degree programme, **Management Common/Management (Public) (Special)/Estate Management and Valuation (Special)/ Business Information Systems (Special) and B. Com (Special)** for the academic year 2019/2020 in the Faculty of Management Studies and Commerce of the University of Sri Jayewardenepura.

### 1. Online Registration through internet

You are required to register through internet from **01.03.2021 to 04.03.2021**. It is compulsory to read and understand the following matters before the registration process.

i. Please visit the University website **www.sjp.ac.lk** and select **"Student Enrolment"**
ii. Login by using your NIC number and Advance Level examination number.
iii. After login you will have to complete the given application form please follow the instruction before submit the application.

- Please take soft copy of passport size (45mm x 35mm) photograph from studio and upload soft copy of photograph (white background with colour bust) from **.jpg** format.

  (Other photograph including scan photo, photo with spectacles, laughing, wearing cap, fade colour, etc. should not be included.)

- Certified photocopy of your Birth Certificate, certified photocopy of your National Identity Card upload from scan **.pdf** format.

  Note: - Photocopies of above certificates should be certified by a Justice of Peace (JP) before upload from scan **.pdf** format.
  - English translation of Birth Certificate - only for Tamil Language Birth Certificate holders. (Should be uploaded English translation only from scan **.pdf** format.)

- Please fill the declaration related to students undertake not to engage in any form of ragging. Please upload from scan **.pdf** format.

  Note: - If you don't have enough time to obtain signature from school principal or Grama Niladhari please upload it within the month through online.

iv. Hostel Facilities / Bursary
If you are applied for hostel facilities/ bursary please tick √ and fill the applications.

v. After fill the application you are able to enter the payment system. Your admission fee for the first academic year is **Rs.550/-**. Please enter **550/-** you will receive bank account number unique to you. Please be good enough to do the payment in cash using the above bank account number and details before **04.03.2021**. Cash payment should be paid any branch of the People's Bank with deposit slip of the People's Bank.

**Please keep all original documents you applied for registration for further reference in future.**

**2. University Identity Card**

All the students will be issued with University Identity Card.

**3. Delays in the University Entrance**

The registered students who are unable to join the academic programme 2019/2020 due to medical or other specific reasons can get the admission extended only by one academic year. Such applications should be submitted to Dean/ Faculty of Management Studies and Commerce , along with medical certificates and other relevant documents. This application should be made only after you are admitted as a student by the university authorities.

**4. Late Registration**

The students who have not been admitted on the due date or students, who haven't got their entrance extended duly, will not be considered for admission later, as steps will be taken by the university to fill such vacancies.

**5. Student Handbook**

The Student Handbook is an official document containing information about the University for students. Soft copy including Sinhala, Tamil and English languages can be downloaded from University website. (www.sjp.ac.lk/students)

**L. L. Wasantha Perera**
Deputy Registrar
Academic Student Affairs & Publications Division

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA


දුරකථනය / Telephone: 2802695, 2802696, 2803191, 2803192

ෆැක්ස් / Fax: 2801604

E. Mail: unisj@sjp ac.lk

මගේ අංකය / My Number:

ඔබේ අංකය / Your Number:

නුගේගොඩ
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.

තැපැල් පෙට්ටිය- 6 නුගේගොඩ.
Post office box-6-
Nugegoda.


18-Feb-21

Dear Student,

**<u>Providing hostel facilities and bursaries to the new entrants for the academic year 2019/2020</u>**

Hostel facilities and bursaries for the new entrants are provided by the Student Welfare Division of the University. Arrangements have been made to obtain relevant information and details through university web site ( www.sjp.ac.lk → Student Enrollment ) to consider providing above facilities.

Students those who wish to apply for the hostel facilities and bursary should complete the Registration form in the website and submit online within one week after receiving this letter.

Further, students are requested to download / print Hostel and Bursary Application forms from the website and should send completed application forms to the following address by registered post with in two weeks. (information in this forms should get certified by the Grama seva Niladari and the Divisional Secretary of the area).

Senior Assistant Registrar,
Student Welfare Dividion,
University of Sri Jayewardenepura,
Gangodawilla, Nugegoda.

Senior Assistant Registrar / Student Welfare

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

දුරකථනය } 2802695, 2802696
Telephone } 2803191,2803192

ෆැක්ස් } 2801604
Fax

E. Mail } unisj@sjp ac.lk

නුගේගොඩ
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.

තැපැල් පෙට්ටිය- 6 නුගේගොඩ.
Post office box-6-
Nugegoda.


මගේ අංකය }
My Number

ඔබේ අංකය }
Your Number

2021-02-18

ප්‍රිය ශිෂ්‍ය / ශිෂ්‍යාව,

<u>**නවක සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් හා ශිෂ්‍යාධාර ලබාදීම - 2019/2020 අධ්‍යයන වර්ෂය.**</u>

මෙම විශ්වවිද්‍යාලයට තේරීපත් වී ඇති නවක සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් හා ශිෂ්‍යාධාර ලබාදීම විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සුභසාධක අංශය මඟින් සිදුකරනු ලබන අතර නේවාසික පහසුකම් හා ශිෂ්‍යාධාර ලබාදීම සඳහා අවශ්‍ය තොරතුරු විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය ඔස්සේ ලබා ගැනීමට කටයුතු යොදා ඇත.

ඒ අනුව විශ්වවිද්‍යාලීය වෙබ් අඩවියට පිවිස (www.sjp.ac.lk ⟶ Student Enrollment ) එහි ඇති ලියාපදිංචිය සඳහා වූ ආකෘතිපත්‍රය සම්පූර්ණ කර "submit" කරන්න. (නේවාසික පහසුකම් හා ශිෂ්‍යාධාර ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන සිසුන් එම ආකෘතිපත්‍රයෙහි ඇති "Section D:" සම්පූර්ණ කලයුතු වේ.) ඊට අමතරව නේවාසිකාගාර හා ශිෂ්‍යාධාර ලබාදීම සලකා බැලීම සඳහා සම්පූර්ණ කර එවිය යුතු අයදුම්පත් "download" කර අදාල ආකෘති පත්‍ර මුද්‍රණය කර ගැනිමෙන් පසු අවශ්‍ය තොරතුරු ඇතුලත් කර එම තොරතුරු ග්‍රාමසේවා නිලධාරි හා ප්‍රාදේශිය ලේකම්වරයාලවා සහතික කරවාගෙන මෙම ලිපිය ලැබී සති දෙකක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමුකළ යුතුවේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
ශිෂ්‍ය සුභසාධක අංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / ශිෂ්‍ය සුභසාධක අංශය

## DECLARATION BY THE CANDIDATE / STUDENT

NOTE: It is mandatory for the candidate/student to place his/her signature before Principal of the School from where the student sat the G.C.E (A/L) Examination in case of a School Candidate and the Grama Niladhari of the area of the permanent place of residence of the candidate /student certified by Divisional Secretary in case of a Private Candidate.

1. I ............................................................... have carefully read and fully understood the law prohibiting ragging referred in the Prohibition of Ragging and Other Forms of Violence in Educational Institutions Act. No:20 of 1998.
2. I hereby undertake that:
   - 2.1 I will not indulge in any behavior act that may come under the definition of ragging
   - 2.2 I will not participate in or abet or propagate ragging in any form
   - 2.3 I will not hurt anyone physically or psychologically or cause any other harm
3. I hereby agree that if found guilty of any form of ragging. I may be punished as per the law enforced and by-laws of the University.

   Signed this on the ........ day of the month of ...................... in the year .................

..............................
Signature of the Student
Name: .................................................
Address: ..............................................
..............................................

Signed before me

...............................
Signature of Principal
Name: ........................
Official Seal:

..........................
Signature of the Grama Niladhari
Name: ........................
Official Seal:

..........................
Signature of the Divisional Secretary
Name: ........................
Official Seal:

## UNDERTAKING BY THE PARENT / GUARDIAN

01. I ............................................................... have carefully read and fully understood the law prohibiting ragging referred in the Prohibition of Ragging and Other Forms of Violence in Educational Institutions Act. No:20 of 1998.
02. I assure you that my son/daughter/ward will not indulge in any form of ragging.
03. I hereby agree that if he/she is found guilty of any form of ragging he/she may be punished as per the law enforced and by-laws of the University.

...............................
Signature of Mother/Father/Guardian
Name: .................................................
Relations to the Student: .............................
Address: ..................................................................................

**ඉල්ලුම්කරු / ශිෂ්‍යයාගේ ප්‍රකාශය**

සටහන: අ.පො.ස (උ.පෙළ) විභාගයට පාසල් අයදුම්කරුවෙකු ලෙස පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ සිසුන් මෙම ප්‍රකාශයට ඔහු / ඇය විසින් එම විභාගයට පෙනී සිටි පාසලේ විදුහල්පති ඉදිරියේදී අත්සන් තැබිය යුතු අතර උසස් පෙළ විභාගයට පෞද්ගලික අයදුම්කරුවෙකු ලෙස පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ සිසුන් තමාගේ ස්ථිර පදිංචියට අයත් ග්‍රාම සේවක කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී ඉදිරියේ අත්සන් තැබිය යුතුය. එවැනි අවස්ථාවකදී අදාල ප්‍රාදේශීය ලේකම් විසින් එය සහතික කළ යුතුය.

1)........................................................වන මා විසින් 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතන වල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත ඉතා සැලකිල්ලෙන් කියවා තේරුම් ගතිමි.

2) මම මින්,

2.1 නවක වදය යන අර්ථකථනය යටතට ගැනෙන කිසිදු හැසිරීමක් හෝ ක්‍රියාවක නිරත නොවන බවටත්

2.2කිසිදු ආකාරයක නවක වද ක්‍රියාවකට සහභාගිවීමක් හෝ අනුබල දීමක් හෝ ප්‍රචාරය කිරීමක නිරත නොවන බවටත්

2.3 කිසිදු පුද්ගලයකුට ශාරීරිකව , මානසිකව හෝ වෙනත් හිංසාකාරී ක්‍රියාවක නිරත නොවන බවටත් සහතික වෙමි.

3) ඕනෑම ආකාරයේ නවක වද ක්‍රියාවක නිරතවී වැරදිකරු වුවහොත් බලපවත්වනු ලබන නීති සහ විශ්වවිද්‍යාලයේ අතුරු ව්‍යවස්ථා අනුව දඬුවම් ලැබිය හැකි බවට එකඟ වෙමි.

..................වර්ෂයේ..................මාසයේ ........දින අත්සන් තබන ලදී.

..................................

ශිෂ්‍යයාගේ අත්සන

නම: ................................................

ලිපිනය:............................................

..............................................

..............................................

මා ඉදිරියේ අත්සන් කරන ලදී.

..................................

විදුහල්පතිගේ අත්සන

නම:..................................

නිල මුද්‍රාව:

.....................................

ග්‍රාම නිලධාරීගේ අත්සන

නම:.........................................

නිල මුද්‍රාව:

.............................................

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන

නම:.................................

නිල මුද්‍රාව:

**දෙමාපියන් / භාරකරුවන්ගේ පොරොන්දුව**

01....................................................... වන මා විසින් 1998 අංක20 දරන අධ්‍යාපන ආයතන වල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත ඉතා සැලකිල්ලෙන් කියවා තේරුම් ගතිමි.

02. මගේ පුතා/දියණිය/රක්ෂිතයා කිසිදු ආකාරයක නවක වදය සම්බන්ධ ක්‍රියාවක නිරත නොවන බවට සහතික කරමි.

03.ඔහු හෝ ඇය විසින් කිසියම් ආකාරයක නවක වදය සම්බන්ධ ක්‍රියාවක නිරත ව වරදකරු වුවහොත් ඔහු හෝ ඇය බලපවත්වනු ලබන නීති සහ විශ්වවිද්‍යාල අතුරු ව්‍යවස්ථා අනුව දඬුවම් ලැබිය හැකි අයකු බවට එකඟ වෙමි.

..................................

මව/පියා/භාරකරුගේ අත්සන

නම:...............................................................

ශිෂ්‍යයාට ඇති සම්බන්ධතාවය :...................................

ලිපිනය: ......................................................................................

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA
## ශාරීරික අධ්‍යාපන අංශය
## Department of Physical Education

දුරකථන :2803475 අභ්‍යන්තර :1514,1515 ෆැක්ස් :
Telephone : Intercom : Fax :


2021.02.16

ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා පිළිබද කටයුතු කරනු ලබන අංශය ශාරීරික අධ්‍යාපන අංශය වන අතර නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලෙස විශ්වවිද්‍යාලයට ඇතුලත්වන ඔබට මෙම විශ්වවිද්‍යාලයේදි පහත සදහන් ක්‍රීඩා සදහා සහභාගි විමට අවස්ථාව සලසා ඇත.

නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් සදහා නවක තරගද, සියළුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් අන්තර් පීඨ විවෘත තරගද, ශාරීරික අධ්‍යාපන අංශයේ අධීක්ෂණය යටතේ පැවැත්වේ. අප විශ්වවිද්‍යාලයීය කණ්ඩායම් නියෝජනය කිරිම සදහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගනු ලබන්නේ ඉහත තරගවලින් පසුවය. ඒ තුලින් අන්තර් විශ්ව විද්‍යාල ක්‍රීඩා තරග සදහා විශ්ව විද්‍යාලය නියෝජනය මෙන්ම ජාතික තරග නියෝජනය කිරීමේ අවස්ථාවද ඔබගේ හැකියාවන් හා දක්ෂතාවන් මත හිමිවනු ඇත.

අන්තර් විශ්වවිද්‍යාල හා ජාතික තරගවලදි දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් විවිධ ජාත්‍යන්තර තරගාවලින්ට සහ වසර දෙකකට වරක් පැවැත්වෙන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරගාවලිය සදහා සහභාගි විමට සුදුසුකම් ලබනු ඇත.
විශ්වවිද්‍යාලයේදි ඔබට සහභාගි විය හැකි ක්‍රීඩා පහත පරිදි වේ.

ක්‍රිකට් (පිරිමි), පාපන්දු (පිරිමි), මල්ලවපොර (පිරිමි), රගර් (පිරිමි) , බරඉසිලීම් (පිරිමි/කාන්තා), තයිකොන්ඩෝ (පිරිමි/කාන්තා), පැසිපන්දු (පිරිමි/කාන්තා), නෙට් බෝල් (කාන්තා), හොකී (පිරිමි/කාන්තා), මලල ක්‍රීඩා (පිරිමි/කාන්තා), මාර්ග ධාවන තරග (පිරිමි) , පිහිණුම් (පිරිමි/කාන්තා), කැරම් (පිරිමි/කාන්තා), බේස්බෝල් (පිරිමි), බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා), ඉෑසපන්දු (පිරිමි/කාන්තා), ටෙනිස් (පිරිමි/කාන්තා), වොලිබෝල් (පිරිමි/කාන්තා), එල්ලේ (පිරිමි/කාන්තා), චෙස් (පිරිමි/කාන්තා), කරාතේ (පිරිමි/කාන්තා).

සෑම වසරක් අවසානයේදිම විශේෂ ක්‍රීඩා කුසලතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට විශ්වවිද්‍යාල වර්ණ ප්‍රදානය කරනු ලබන අතර අන්තර් විශ්වවිද්‍යාල තරගවලදී දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සෑම වසරක් අවසානයේදිම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සම්මාන ප්‍රදානය කෙරේ. විශ්වවිද්‍යාලය තුලදි ඉහත සදහන් කර ඇති ක්‍රීඩා සදහා සහභාගි විමට හැකි අතර මේ සමග ඇති ඉල්ලුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට මෙය ලැබී දින 07ක් ඇතුලත තැපැල් මගින් ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂිකා, ශාරීරික අධ්‍යාපන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල නුගේගොඩ යන ලිපිනයට ලැබීමට සලස්වන මෙන් දන්වමි.

මෙයට විශ්වාසි,

නිශාන්ති විදානගේ
ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂිකා

Dear Student,

The key organization of sports and physical activities in the University of Sri Jayewardenepura is the Department of Physical Education. The Department has made opportunities for the freshers to participate in the following games at the University premises.

Fresher's Championships for the first year students and Inter Faculty Championships for all students are organized under the supervision of the Department of Physical Education. Selection of sports men & women for the representation of the university takes place upon the performance of the players. Those who excel in the performance at the end of Inter University Championships will receive University colors and awards from Sri Lanka University Sports Association.

Students who performed well at the National and Inter University Games qualify for World University Games which is held once in two years and International Championships.

You may participate in the following events which are held under the supervision of Department of Physical Education.

| | | |
|---|---|---|
| Track & Field (Men/Women) | Football (Men/Women) | Taekwondo (Men/Women) |
| Badminton (Men/Women) | Hockey (Men/Women) | Tennis (Men/Women) |
| Baseball (MEN) | Karate (Men/Women) | Volleyball (Men/Women) |
| Basketball (Men/Women) | Netball | Weightlifting |
| Carrom (Men/Women) | Road Race (Men) | Wrestling |
| Chess (Men/Women) | Rugby | Power Lifting |
| Cricket (Men) | Swimming (Men/Women) | |
| Elle (Men/Women) | Table Tennis (Men/Women) | |

If you are interested in taking part in the above sports at the University, hand over a dully filled application form (given over leaf) to the Director, Department of Physical Education, University of Sri Jayewardenepura by post within 7 days of receipt this document.

Sincerely,

Nishanthi Vidanage
Director in Physical Education

1. නම ( Name):-

2. ස්ථිර ලිපිනය ( permenant Adress) :-

3. දුරකතන අංකය (Tele. No.) :-

4. ඇතුලත් වන පීඨය (Faculty ):-

5. ලියාපදිංචි අංකය (Registration No.):-

| | |
|---|---|
| 6. උපන් දිනය (Date of Birth) :- | වයස (Age as at 31st Dec. 2020) :-<br>(2020 දෙසැ: 31 දිනට) |

7. අවසන් වරට අධ්‍යාපනය ලැබූ පාසැල (Last School, you attended) :-

8. පෞද්ගලික අපේක්ෂකයෙක් නම් අධ්‍යාපනය ලැබූ පාසැල (if a private candidate, School attended):-

9. පාසැලේදී හෝ ඉන් පිටතදි සහභාගි වී ඇති ක්‍රීඩා ( Sports you participated in & out of school) :-

10. නියෝජනය කර ඇති ක්‍රීඩා / ක්‍රීඩාව වසර සමග සදහන් කරන්න ( Sports you represented with the year) :-

i. මාණ්ඩලික තරග (Circuit) :-

ii. දිස්ත්‍රික් තරග ( District) :-

iii. පළාත් තරග (Provincial) :-

iv. සමස්ථ ලංකා (All Island):-

v. ජාතික තරග (National):-

vi. ශ්‍රී ලංකා නියෝජනය (National Representation/s) ;-

11. ක්‍රීඩා පිළිබද විශේෂ දක්ෂතා සහ සම්මාන ඇත්නම් ඒ පිළිබද විස්තර (Mention special Award and Best Performance, if any) :-

12. ඔබ විශ්ව විද්‍යාලයේදි සහභාගි වීමට කැමති ක්‍රීඩා (Sports, you like to participate in the University :-

| | |
|---|---|
| දිනය ( Date):- | අත්සන ( Signature):- |